# බුදුන් වහන්සේගේ ඤාණබලය හා උග්‍රතපස විග්‍රහ කෙරෙන මහාසීහනාද සූත්‍රය

- පූජ්‍ය ශාස්ත්‍රවේදී වැවල ධම්මාලෝක හිමි -

**හැඳින්වීම**

මහා සීහනාද සූත්‍රය සූත්‍ර පිටකයේ මැදුම් සඟියේ මූල පණ්ණාසකයට අයත් සීහනාද වග්ගයේ දෙවැනි සූත්‍රය යි. එසේ වුවත් ත්‍රිපිටකයේ ස්ථාන කිහිපයක ම සීහනාද යනුවෙන් හඳුන්වා ඇති සූත්‍ර ගණනාවක් දක්නට ඇත.[i] මෙම දේශනාවලදී බුදුන් වහන්සේ තුළ පිහිටි උත්තර මනුෂ්‍ය ධර්ම, නිර්භයභාවය සහ මිථ්‍යා දෘෂ්ටි ප්‍රහාණය පිළිබඳ කරුණු විස්තර කොට ඇති ආකාරය පොදුවේ දක්නට ලැබේ. මෙහි සාකච්ඡාවට භාජනය වන මහාසීහනාද සූත්‍රයෙහි බුදුන් වහන්සේ කෙරෙහි පිහිටියා වූ දසබල ඥානය ඇතුළු අනෙක් උත්තර මනුෂ්‍ය ධර්මයන් සහ බෝධිසත්ව අවධියේ දී සිද්ධාර්ථ තාපසතුමන් විසින් පිළිපදින ලද අති දුෂ්කර අචේලක ආදී තපස් ව්‍රත පිළිබඳව විස්තර ඇතුළත් වේ. දඹදිව පහළ වූ මහා ශාස්තෘවරයාණන් හා විමුක්ති දායකයාණන් වශයෙන් බුදුන් වහන්සේ පිළිබඳ සමකාලීන සමාජයේ පැතිරෙමින් තිබූ වැරදි මත හා සැක සංකා දුරු කිරීම මෙවැනි දේශනා වල අරමුණ වූවා විය හැකිය. මෙවැනි දේශනා මගින් උන්වහන්සේ කෙරෙහි වූ සුවිශේෂ ඤාණ ශක්තීන් හා සද්ධර්මයේ උත්තරීතරත්වය පිළිබඳ සිංහයෙකු මෙන් නිර්භය ලෙස ලොවට ප්‍රකාශ කරන ලදී.

## සූත්‍ර සාරය

මහාසීහනාද සූත්‍රයේ විස්තර කෙරෙන ධර්මය තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද්දේ, විසාලාවේ නගර සීමාවෙන් පිටත බටහිර වන ලැහැබෙහි වැඩසිටින අවස්ථාවක දී ය. ලිච්ඡවි රාජ පුත්‍ර සුනක්ඛත්ත නැමති භික්ෂුව සිවුරු හැර ගිහි බවට පැමිණ නොබෝ කලකින් විසාලා නුවර වැසි පිරිස් රැස් කරවා බුදුන් වහන්සේ තුළ සාමාන්‍ය මිනිසෙකුට වඩා විශේෂ වූ ඤාණයක් නොමැත්තේ යැයි ප්‍රකාශ කරමින් සිටියේ ය. අග්‍රශ්‍රාවක සාරිපුත්ත තෙරුන්ට විසාලාවට පැමිණි අවස්ථාවේ දී සුනක්ඛත්ත විසින් බුදුන් වහන්සේ පිළිබඳ ජනතාව ඉදිරියේ කරනු ලබන මෙම ප්‍රකාශ අසන්නට ලැබිණි. අනතුරුව සැරියුත් තෙරුන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේට සුනක්ඛත්තගේ මෙම ප්‍රකාශ පිළිබඳව සැළ කරන ලදී. එම අවස්ථාවේදී බුදුන් වහන්සේ සුනක්ඛත්ත හිස් මිනිසෙකු බවත් තමන් වහන්සේ කෙරෙහි වූ උත්තර මනුෂ්‍ය ධර්මයන් දැනීමේ හැකියාවක් ඔහුට නොමැති බවත් සඳහන් කරමින් සාරිපුත්ත තෙරුන්හට තමන් වහන්සේ කෙරෙහි පිහිටියා වූ ඤාණ බල පිළිබඳ පහදා දුන්හ.

බුදුරදුන් තුළ පිහිටියා වූ ඤාණ බල පිළිබඳ විස්තරයෙන් අනතුරුව සූත්‍රයේ දෙවැනි අනුසන්ධිය වශයෙන් විස්තර කොට ඇත්තේ සිද්ධාර්ථ බෝසතාණන් විසින් පිළිපදින ලද අති දුෂ්කර ප්‍රතිපදාව යි. සුනක්ඛත්ත අචේලක ආදී දැඩි දුෂ්කර ප්‍රතිපදා පිරුමෙන් විමුක්තිය ලැබිය හැකි යැයි මිථ්‍යා ලබ්ධි ඇත්තෙක් විය.[ii] එබැවින් මෙහිදී බුදුන් වහන්සේ විසින් අනුගමනය කරන ලද අචේලකභාවය, රළු තපස්ව්‍රත, ප්‍රකෘෂ්ටවිවේකය, දුස්භෝජනය, අල්පාහාරය ආදී වූ දුෂ්කර පිළිවෙත් විස්තර කරන ලදී. බෝසතාණන් ගේ දුෂ්කර ප්‍රතිපදාව කෙතරම් උග්‍ර වූවක් ද යත් එය ලොව එම පිළිවෙතෙහි යෙදෙන කිසිවෙකුටත් නොදෙවෙනි වූවකි. මෙම ප්‍රතිපදාවන් පැහැදිලි කොට අවසානයේ දී බුදුරදුන් ප්‍රකාශ කරන්නේ "සාරිපුත්තය, මම ඒ දුෂ්කර ප්‍රතිපදාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩි වූ ආර්යභාවයක් ප්‍රතිඥා කිරීමට සමත් වූ දර්ශන විශේෂයක් නො ලදිමි" යනුවෙනි.[iii] මෙහි දී බුදුන් වහන්සේ බොහෝ භවයන්හි ඉපදීමෙන් හා ගිනි පිදීමෙන් ශුද්ධිය වෙතැයි යන මිථ්‍යා ලබ්ධිය ද උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ හ.



බුදුන් වහන්සේගේ ඥාන ශක්තීන් ලොව කිසිදු ඥාන ලාභියෙකුට සම කළ නොහැකි තරම් වේ. ඒවායේ බලවත් බව ජීවිතය වියපත් වීමෙන් හෝ නැසී නො යයි. යම් තැනැත්තෙක් යොවුන් බව නැති වීයාමෙන්, වියපත්වීමෙන් හෝ ඤාණය නැසී යන්නේ යැයි කියන්නේ නම් එය බොහෝ දෙනා සම්බන්ධයෙන් සත්‍ය විය හැකි ය. එසේ වුවත් බුදුන් වහන්සේ කෙරෙහි එබඳු ප්‍රකාශයක් කළ නො හැක. උන්වහන්සේ කෙරෙහි පිහිටියා වූ ඤාණ බල අසූ වයස මුහුකුරා යාමෙන් වුව නො පිරිහෙන්නේ ය. වයෝවෘද්ධ වූ තථාගතයන් ඇඳක තබා පරිහරණය කරන්නේ වුව ද උන්වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙහි වෙනසක් නො වන්නේ ය. මෙම දේශනාව පවත්වන අවස්ථාවේ දී නාගසමාල තෙරුන් වහන්සේ බුදුරදුන්ට පසුපසින් හිඳ පවන් සලමින් සිටියහ. මේ දේශනාව ඇසූ උන්වහන්සේ එය ආශ්චර්යමත් අද්භූත දේශනාවක් බවත් තමන්ගේ ලොමුදැහැගත් බවත් පැවසූහ. මෙම ධර්මක්‍රමය කුමක් දැයි විමසූ නාගසමාල හිමියන්ට බුදුරදුන් විසින් එය ලෝමහංස පරියාය වශයෙන් දරන්නැයි වදාරන ලදී. බුද්ධ දේශනා අතුරින් සමහරක් ආශ්චර්යමත් ඒවා වේ. මෙහි සඳහන් වන බුදුන් වහන්සේ විසින් උපදවා ගන්නා ලද ඤාණ ශක්ති හා උන්වහන්සේ අනුගමනය කරන ලද තපස් ව්‍රත පිළිබඳ විස්තර සාමාන්‍ය මිනිසෙකුගේ අත්දැකීම් සීමාව ඉක්මවා පවතී. ඒවා පිළිබඳ ඇසූ ශ්‍රාවකයෝ විශ්මයටත් බුදුන් කෙරෙහි අතිමහත් ශ්‍රද්ධාවටත් පත් වූහ. නවාංග ශාස්තෘ ශාසනයෙහි අබ්භූත ධම්ම යනුවෙන් සඳහන් වන්නේ මේ ආකාරයේ දේශනා විය යුතු ය.

## සනක්ඛත්තගේ ද්වේෂය

සිවුරු හැර ගිය සුනක්ඛත්ත බුදුරදුන් කෙරෙහි උත්තර මනුෂ්‍ය ධර්මයක් නෙමැති බව විසල් පුර වැසියන් ඉදිරියේ ප්‍රකාශ කිරීමට හේත